# 3 සංදේශ වර්ගීකරණය

**හෂේන් :** අම්මේ, මේ බලන්න.

**අම්මා :** මොනවද පුතා?

**හෂේන් :** මගේ ලිපිය පත්තරේ පළ වෙලා.

**අම්මා :** ඇත්ත නේන්නම්. "සුබවාදී ව ජීවත්වීම අභියෝගයක් ද?" මට හරි ආඩම්බරයි පුතා ගැන. ඔයා පුංචි කාලෙ ඉඳල ම ලියන්න දක්ෂ යි.

**හෂේන් :** මටත් හරි සතුටුයි අම්මේ, මගේ ලිපිය ගොඩක් දෙනා කියවයි. පන්තියේ ටීචත් මට කීවා, කාලය තියන හැම වෙලාවක ම ලියන්න කියලා.

**අම්මා :** ඒක තමයි පුතා, ඔයා හොඳ ලේඛකයෙක් වෙන්න ඕනෑ. ලේඛකයකුට සමාජයට විශාල සේවයක් කරන්න පුළුවන්. ඒ වගේ අය කොච්චර ඉන්නව ද? පුතා දන්නවානේ නව ගිවිසුමේ අපට වැදගත් වන සුවිශේෂී ලේඛකයෙක් තමයි ශුද්ධ වූ පාවුලු තුමා.

**හෂේන් :** ශුද්ධ වූ පාවුලු තුමා මුල් කිතුනු සංඝයට ලේඛකයෙක් ලෙස වැඩි සේවයක් ඉටු කළා. එතුමා තමා නව ගිවිසුමෙ වැඩි ම පොත් ගණනක් ලිව්වේ, මටත් ආසයි ඒ වගේ වෙන්න.

අපෝස්තලික යුගයේ දී ශුද්ධ වූ සභාවට මහගු සේවයක් කළ විශිෂ්ඨ පුද්ගලයකු ලෙස ශුද්ධ වූ පාවුලු තුමා හැඳින්විය හැකි ය. නව ගිවිසුමේ හසුන් විසිඑකෙන් දහතුනක ම කර්තෘත්වය ශුද්ධ වූ පාවුලු තුමාට හිමි වේ. එතුමා මෙම ලිපි ලියා ඇත්තේ, විවිධ සංඝවලට හා පුද්ගලයින්ට ය. කිතුනු සංඝවලට උපදෙස් දීම සඳහා ලියූ එම ලිපිවලින් එතුමාගේ නායකත්වයත් විවිධ සංඝ සමග එතුමා සබඳතා පැවැත් වූ ආකාරයත් පැහැදිලි ය.

## ශු. පාවුලු තුමා ලිපි (හසුන්) ලිවීමේ පරමාර්ථ

### 1. කාර්ය බහුලත්වය නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ අපහසුව

ශුද්ධ වූ පාවුලු තුමාට යම් කිතුනු සංඝයක් පෞද්ගලික ව හමුවිය නොහැකි අවස්ථාවල ලිපි මාර්ගයෙන් මඟ පෙන්වී ය. එමගින් ඒ ඒ කිතුනු සංඝවල ගැටලු නිරාකරණය කිරීමට අමතර ව අවවාද අනුශාසනා දුන් බවත්, ඔවුන්ගේ විශ්වාසය ස්ථිර කළ බවත් පැහැදිලි ය. තව ද දේව ධාර්මික හා එඬේරික උපදෙස් ඒවායේ අන්තර්ගත වේ.

## 2. සිරගත ව සිටීම නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ නොහැකියාව

සිරගත ව සිටීම නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ නොහැකියාව නිසා ද ශුද්ධ වූ පාවුලු තුමා ලිපි ලීවේ ය. උදහරණ :-

1. කොලොස්සි නුවර බොරු ගුරුවරුන් වැරදි ඉගැන්වීම් කර තිබූ නිසා ඒවා නිවැරදි කිරීමට ශුද්ධ වූ පාවුලු තුමා සිර මැදිරියේ සිට ම කොලොස්සි ලිපිය ලියා ඇත.
2. ශුද්ධ වූ පාවුලු තුමා සිරගත ව සිටින විට ක්‍රිස්තු භක්තිකයින් විශ්වාසයේ ස්ථිර ව සිටින ලෙස දන්වා පිලිප්පි ලිපිය ලියා ඇත.
3. ශුද්ධ වූ පාවුලු තුමා පිලෙමොන් නමැති කිතුනු බැතිමතෙකුට ලියන ලද පෞද්ගලික ලිපිය ලියන ලද්දේ ද සිරගත ව සිටින අවස්ථාවක දී ය.

# ශුද්ධ වූ පාවුලු තුමාගේ හසුන් වර්ගීකරණය

## 1. ශුද්ධ වූ පාවුලු තුමා විසින් ම ලියන ලද සංදේශ

ශුද්ධ වූ පාවුලු තුමා විසින් ම ලියන ලද සංදේශ 7 කි. ඒවා නම් රෝම, 1 කොරින්ති, 2 කොරින්ති, ගලාති, පිලිප්පි, 1 තෙසලෝනික හා පිලෙමොන් ය.

## 2. ද්විතීය පාවුලු සංදේශ

ශුද්ධ වූ පාවුලු තුමාගේ අදහස් වෙනත් අය විසින් රචනා කර ඇති සංදේශ ද්විතීය පාවුලු සංදේශ වේ. ද්විතීය පාවුලු සංදේශ 2 කි. ඒවා නම්, එපීස හා කොලොස්සි වේ.

## 3. ආරූඪ කර්තෘත්වය

ආරූඪ කර්තෘත්වයෙන් යුතු හසුන් 4කි. එනම්, 2 තෙසලෝනික, 1 තිමති, 2 තිමති හා තීතස් වේ.

## වෙනත් හසුන්

ශුද්ධ වූ පාවුලු තුමාගේ හසුන්වලට අමතර ව වෙනත් සංදේශ 8ක් ද නව ගිවිසුමෙහි ඇත. මේවායින් හෙබ්‍රෙව්වරුන්ට යොමුවුණු හසුන හැර සෙසු කෘතීන් හත ම කිතු සමිඳුන්ගේ අපෝස්තුලුවරුන් වූ පේදුරු, ජොහන්, ජුද් හා ජාකොබ් තුමන්ලා විසින් ලියා ඇත. මේවා (කතෝලික සංදේශ, විශ්ව සංදේශ) හෝ සමාන්‍ය හසුන් ලෙස ද හඳුන්වනු ලැබේ.

**සංදේශ වර්ගීකරණය**

- **ශු. පාවුලු තුමාගේ සංදේශ (13)**
  - **ශු. පාවුලු තුමා විසින් ම ලියන ලද සංදේශ (7)**
    1. රෝම
    2. 1 කොරින්ති
    3. 2 කොරින්ති
    4. ගලාති
    5. පිලිප්පි
    6. 1 තෙසලෝනික
    7. පිලෙමොන්
  - **ද්විතීය පාවුලු සංදේශ (2)**
    1. එපීස
    2. කොලොස්සි
  - **ආරූඪ කතෘත්වය (4)**
    1. 2 තෙසලෝනික
    2. 1 තිමති
    3. 2 තිමති
    4. තීතස්
- **වෙනත් සංදේශ (8)**
  1. හෙබ්‍රව්
  2. ජාකොබ්
  3. 1 පේදුරු
  4. 2 පේදුරු
  5. 1 ජොහන්
  6. 2 ජොහන්
  7. 3 ජොහන්
  8. ජුද්

## ක්‍රියාකාරකම

1. ශුද්ධ වූ පාවුලු තුමා විසින් ම රචිත සංදේශ 7 නම් කරන්න.

2. "ශුභාරංචිය පතළ කිරීමට කතෝලික ලේඛකයකුගේ දායකත්වය" යන මැයෙන් ශු. පාවුලු තුමාගේ සංදේශ පිළිබඳ කෙටි රචනාවක් ලියන්න.

3. ඉරුදින දිව්‍ය පූජාවේ දෙවන කියවීම සඳහා බොහෝ විට ශුද්ධ වූ පාවුලු තුමාගේ සංදේශ භාවිත කරයි. අද සිට මාස තුනක පමණ කාලයක් තුළ දී දෙවන කියවීම සඳහා ගනු ලබන ශුද්ධ වූ පාවුලු තුමාගේ සංදේශ මොනවාදැයි ඔබේ සටහන් පොතෙහි වගුගත කරන්න.

*ජීවිතය සඳහා*

- *දිනපතා ඔබේ යාච්ඤාවේ දී ශුද්ධ වූ පාවුලුතුමාගේ ලිපියකින් කොටසක් කියවා මෙනෙහි කරන්න.*
- *දිව්‍ය පූජාවේ දී කියවන කියවීම්වලට සාවධාන ව ඇහුම්කන් දෙන්න.*
- *පුවත්පත් සඟරා ආදියෙන් ශුද්ධ වූ පාවුලු තුමා පිළිබඳ විස්තර සොයාගෙන කියවා දැනුවත් වන්න.*